සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය

## සාමාජික හා සාමාජික ඥාති මරණාධාර යෝජනා ක්‍රමය.

සමිතියේ සංශෝධන කාරක නියෝග මාලාවේ 8:2 අනුව සාමාජික හෝ සාමාජිකයෙකුගේ සමීප ඥාතියෙකුගේ මරණයකදී සහන සැලසීම පිණිස මරණාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ.

2. සමිතියේ සාමාජිකත්වය ලබා මාස 06 ක් ඉක්මවූ සාමාජිකයෙකු වෙනුවෙන් හෝ ඥාතියෙකු වෙනුවෙන් මරණාධාර ඉල්ලුම් කළ හැකිය.
3. සාමාජිකයෙකු මිය ගිය විට වසර 02 ක් ඇතුළත හිමිකරුට මරණාධාර ඉල්ලුම් කළ හැකිය.

- ❖ ඥාති මරණයකදී මරණය සිදු වී මාස 06 ක් ඇතුළත මරණාධාර ඉල්ලුම් කළ යුතුය.
- ❖ ඔබට හිමි මරණාධාර මුදල් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය සමඟ මරණයට පත් වූ අයගේ ඥාතීත්වය තහවුරු වන පරිදි පහත සඳහන් ලේඛණ වල සහතික කරනු ලැබූ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

I. සාමාජික මරණයකදී
  - ➢ හිමිකරු ඉල්ලුම් පත්‍රය සමඟ මරණ සහතිකය
  - ➢ ඥාතීත්වය තහවුරු කරන ලේඛන වල නම් වල වෙනස්කම් ඇත්නම් දිවුරුම් සහතිකයක්

II. කලත්‍රයාගේ මරණයකදී
  - ➢ ඉල්ලුම් පත්‍රය, මරණ සහතිකය, විවාහ සහතිකය
  - ➢ ඥාතීත්වය තහවුරු කරන ලේඛන වල නම් වල වෙනස්කම් ඇත්නම් දිවුරුම් සහතිකයක්

III. මව / පියාගේ මරණයකදී
  - ➢ ඉල්ලුම් පත්‍රය සමඟ මරණ සහතිකය, සාමාජිකයාගේ උප්පැන්න සහතිකය
  - ➢ ඥාතීත්වය තහවුරු කරන ලේඛන වල නම් වල වෙනස්කම් ඇත්නම් දිවුරුම් සහතිකයක්

IV. අවිවාහක දරුවන්ගේ මරණයකදී
  - ➢ මරණ සහතිකය, දරුවාගේ උප්පැන්න සහතිකය, වයස 18 ට වැඩිනම් අවිවාහක බවට සනාථ කර සහතිකය (ග්‍රාම නිලධාරීගෙන් ලබාගත්)
  - ➢ ඥාතීත්වය තහවුරු කරන ලේඛන වල නම් වල වෙනස්කම් ඇත්නම් දිවුරුම් සහතිකයක්

V. පැවිදි හිමියෙකුගේ ගුරුහිමිගේ අභාවයකී
  - ➢ පැවිදි සහතිකය, උපසම්පදා සහතිකය, ගුරුහිමි බවට සනාථ කෙරෙන නිකායේ මහනාමහිමිගේ සහතිකය
  - ➢ ඥාතීත්වය තහවුරු කරන ලේඛන වල නම් වල වෙනස්කම් ඇත්නම් දිවුරුම් සහතිකයක්

VI. මාමා / නැන්දාගේ මරණයකදී
  - ➢ මරණ සහතිකය, විවාහ සහතිකය, කලත්‍රයාගේ උප්පැන්න සහතිකය
  - ➢ ඥාතීත්වය තහවුරු කරන ලේඛන වල නම් වල වෙනස්කම් ඇත්නම් දිවුරුම් සහතිකයක්

4. මරණාධාර යෝජනා ක්‍රමයට දායකවීමෙන් අනතුරුව ඇතුළත් වීමේ ගාස්තු හා කිසියම් මාසයක් හෝ මාස කිහිපයක දායක මුදල් අයවී නොමැතිනම් එම මුදල් ඔබට හිමි මරණාධාර මුදලෙන් අය කරනු ඇත.
5. ඔබ විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය හෝ වංචනිකව ඉදිරිපත් කර ඇති තොරතුරු බවට සනාථවේ නම් මරණාධාර අවලංගු කළ හැකි බව සලකන්න.
6. දායකත්වය අනුව ගෙවීම් කරනු ලබන මුදල

| අරමුදලේ දායක වූ මාස ගණන | සාමාජිකයා | කලත්‍රයා | මව/පියා/අවිවාහක දරුවන්/ පැවිදි | මාමා/නැන්දා |
|---|---|---|---|---|
| 06 – 24 | 35,000.00 | 12,000.00 | 8,000.00 | 4,000.00 |
| 25 – 60 | 40,000.00 | 14,000.00 | 10,000.00 | 6,000.00 |
| 61 - 120 | 45,000.00 | 16,000.00 | 12,000.00 | 8,000.00 |
| 120 ට වැඩි | 50,000.00 | 18,000.00 | 14,000.00 | 10,000.00 |